සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

52 S II

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016
## Third Term Test - Grade 13 - 2016

විභාග අංකය ................................. නැටුම් II කාලය පැය තුනයි

**වැදගත්**

I වන කොටසින් ප්‍රශ්න දෙකකට ද II, III, IV කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

1. i. පහත සඳහන් අලංකාර බෙර පදය ප්‍රස්තාර කරන්න.
   - දොං තකු දොං ජිං තත් ජිං තත් ජිං තරිකිට

   ii. පහත සඳහන් කවි පද මාත්‍රා 3 තනි තිතට ප්‍රස්ථාර කරන්න.
   - සිංහ පුරවර සොඳා - රජ ඉසුර විඳ විඳා

   iii. උඩරට 'කුදංත ගත දොං' වට්ටමේ 'තත් තොග තක තොග....' අඩව්ව සම්පූර්ණයෙන් ප්‍රස්තාර කරන්න.

2. විචිත්‍ර කලාංගයන්ගෙන් සමන්විත දේශීය ශාන්තිකර්ම මනෝ විද්‍යාත්මක වැදගත් කමකින් යුක්තය.
   i. චිත්‍ර කලාවෙහි මූලිකාංග නර්තන කලාව හා බැඳෙන අවස්ථා තුනක් ශාන්තිකර්මයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
   ii. උඩරට හා පහතරට රංග වස්ත්‍රාභරණවල වර්ණ භාවිතය පිළිබඳ සුවිශේෂිතා සංසන්දනාත්මක විස්තරයක් කරන්න.
   iii. සාර්ථක පවුල් ජීවිතයක් ගොඩනංවා ගැනීමට අඹුසැමි යුවලකගේ මනස මෙහෙයවන අයුරු රටයකුම ශාන්තිකර්මය ඇසුරෙන් විමසන්න.

3. නර්තන, ගායන, වාදන මෙන්ම නිරූපණ අවස්ථා ද දේශීය ශාන්තිකර්ම තුළ අන්තර්ගතය.
   i. පහන්මඩු ශාන්තිකර්මයේ එන අඹ විදමන හෝ රාමා මැරීම නාට්‍යමය පෙළපාලියක් ලෙස හැඳින්වීමට හේතු උදාහරණ සහිතව දක්වන්න.
   ii. සන්නි යකුමෙහි චරිත නිරූපණය සඳහා ගායනය සහ වාදනය යොදා ගන්නා ආකාරය විමසන්න.
   iii. කොහොඹාකංකාරි ශාන්තිකර්මය පූජාර්ථයට මුල් තැන දෙමින් ක්‍රියාත්මක වන අයුරු හත්පදය නර්තන අංගය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

## II කොටස

4. දේශීය නර්තනය විකාශනය වීමේ දී දේශීය මෙන්ම විදේශීය වශයෙන් විවිධ බලපෑම් එල්ල වී ඇත.
   i. මහනුවර යුගයේ නර්තන කලාවේ දියුණුව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලද ආකාරය උදාහරණ දෙමින් විස්තර කරන්න.
   ii. නර්තන කලාව කෙරෙහි භාරතීය ආභාසය බලපා ඇති ආකාරය පොළොන්නරු යුගයේ සාධක දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
   iii. කෝට්ටේ යුගයේ බිහි වූ බලි ශාන්තිකර්ම ඇදීමේ හා ඇඹීමේ කලාවක් වශයෙන් ඇගයීමක් කරන්න.

5. ගැමි නැටුම් හා ගැමි නාටකවල එකිනෙකට අනන්‍ය වූ ලක්ෂණ ගොඩ නැගී ඇත.
   i. ගැමි නැටුමක් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු තුනක් පිළිබඳ සාකච්ඡා කරන්න.
   ii. සොකරි ගැමි නාටකයේ එන සොකරි චරිතයෙහි ගති ලක්ෂණ උදාහරණ දෙමින් විස්තර කරන්න.
   iii. කෝළම් නාටකයෙන් සිදුවන සමාජ විවරණය ජස ලෙන්චිනා කෝළම මගින් විමසන්න.

## III කොටස

6. i. රුසියානු බැලේ නාට්‍ය දෙකක් සහ භාරතීය නෘත්‍ය නාටක දෙකක් නම් කරන්න.
   ii. විදේශීය ආභාසය නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ නර්තන නිර්මාණයට මෙන්ම රංග වස්ත්‍රාභරණ නිර්මාණයට ද බලපා ඇත. කරුණු දක්වමින් විමසීමක් කරන්න.
   iii. භාරතීය නෘත්‍ය නාටක හා බටහිර බැලේ සංකල්පය සංසන්දනය කරමින් කරුණු දක්වන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| නවාබ් වජිද් අලීසා | ශබ්දම් | මෘදංග , වීණාව |
| රවීන්ද්‍රනාත් තාගෝර් | ආමද් | තබ්ලාව , සාරංගිය |
| වල්ලතෝල් නාරායන් මෙනන් | පුරප්පාඩ් | මද්දලම් , චෙණ්ඩා |
| ශ්‍රී ගෝපි නාථ | රාස්ලීලා | පුංග් , පේනාව |

7. i. ඉහත සඳහන් වගුවෙහි (අ) , (ආ) , (ඉ) කොටස්වලින් මනිපුරි නර්තන සම්ප්‍රදායට අයත් මාතෘකා එක බැගින් තෝරා ගෙන ඒ පිළිබඳ වෙන වෙනම කෙටි සටහන් ලියන්න.

## IV කොටස

8. දේශීය නර්තන කලාවේ සිදුවූ නව ප්‍රවණතා විවිධ පැතිකඩ ඔස්සේ දිශානුගත වී ඇත. පහත සඳහන් ශීර්ෂ ඔස්සේ පැහැදිලි කරන්න.
   i. අධ්‍යාපනික විෂයයක් වශයෙන්  ii. වාණිජමය කාර්යයක් වශයෙන්
   iii. විනෝදාස්වාද අංගයක් වශයෙන්

9. දේශීය නර්තන කලාව කෙරෙහි නූතන සමාජ ප්‍රවණතා බලපා ඇති ආකාරය පහත අංග ඔස්සේ විමසීමට ලක්කරන්න.
   i. නව තාක්ෂණික මෙවලම් භාවිතය  ii. සමාජීය ආකල්ප හා ආර්ථික රටා
   iii. විදේශීය නර්තනයන් හි ආභාසය